රක්ෂණ ඔප්පුව

නීතිරීති, කොන්දේසි සහ බැහැර කිරීම

1. **පොදු රක්ෂණ නීතිරීති සහ කොන්දේසි (GENERAL POLICY TERMS AND CONDITIONS)**

මෙහි සඳහන් නීතිරීති, කොන්දේසි, සහ බැහැර කිරීම් වලට යටත් ව, **මරණයට පත් වූ විට ලැබෙන ප්‍රතිලාභ (එනම් ජීවිත ආවරණය)** සහ **අසාධ්‍ය රෝග {Critical Illness (CI) Cover} ආවරණය,** මෙම රක්ෂණ ඔප්පුවට ඇතුළත් වේ. මෙම රක්ෂණ ඔප්පුව ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය කෙරෙයි. සන්දර්භය මගින් පිළිගන්නා අවස්ථාවන් හි දී, **ජීවිත රක්ෂිතයා** යන්න මගින්, ඔහුගේ පුද්ගලික නියෝජිතයන් ද, ඒකවචන මගින් බහුවචනය ද, ඕනෑම ස්ත්‍රී-පුරුෂ සමාජ භාවයක් මගින් අන් අය ද අදහස් කෙරෙයි.

පහත ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන් **නැත** යැයි යෝජිත පෝරමයේ ලකුණු කිරීමට යටත්ව ආවරණය සඳහා ඔබ සුදුසුකම් ලබයි.

- *පපුවේ වේදනාව, හෘද රෝග, හෘදයාබාධ, අධි රුධිර පීඩනය, හෝ කොලෙස්ට්‍රෝල් වැඩිවීම ආදී රෝග ලක්ෂණ කවදා හෝ ඔබට ඇති වී තිබේද, ඒ සඳහා ඔබට ප්‍රතිකාර කර තිබේද, හෝ එම රෝග පවතින බවට යම් ඇඟවීමක් හෝ රෝග ලක්ෂණ හෝ තිබුණේද; හෝ*
- *පිළිකා, මස්දලු / ගෙඩි හෝ ගැටිති; හෝ*
- *ආඝාතය; මොළයේ රුධිරය වහනය වීමක් හෝ මොළයට හානි; හෝ*
- *දියවැඩියාව, මුත්‍රා වල රුධිරය, මුත්‍රා වල ප්‍රෝටීන (මාංශජනකධාතු), වකුගඩුවක ඇති වන යම් රෝගාබාධයක්; හෝ*
- *සිරෝසිස් හෝ අක්මාවේ ඇති කිසියම් රෝගාබාධයක්; හෝ*
- *ශරීරයේ කිසියම් දෝෂයක්, විකෘතිතාවක් හෝ යම් ස්නායු ආබාධයක්.*

- *ඉහත රෝග හෝ වෙනත් රෝග සම්බන්ධයෙන් පසුගිය වසර 05 කාලය තුළ ඔබ, වෛද්‍ය නිලධාරියකු හමුවීමට ගොස් තිබේ ද හෝ රෝහල්ගත කර තිබේද, නැතහොත් කිසියම් හෝ වෛද්‍ය පරීක්ෂණයකට (රෝග පරීක්ෂණ, පරීක්ෂාවට බඳුන් කිරීම්) /ශල්‍යකර්මයකට භාජනය වී තිබේද?*

- *ඔබේ පවුලේ සාමාජිකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුට පහත තත්ත්වයන් පැවති බවට කරුණු තිබේද? (හෘද රෝග, වකුගඩු රෝග, පිළිකා, ආඝාතය, දියවැඩියාව).*

- *ඔබ කිසියම් හෝ දිනයක කවර හෝ සාපරාධී වරදකට වැරදිකරු වී තිබේ ද, නැතහොත් ඔබට විරුද්ධව විභාග වෙමින් පවත්නා හෝ විමර්ශනය වෙමින් පවත්නා හෝ නඩු කිසිවක් තිබේද?*

- *ඔබ දේශපාලනිකව අනාවෘත පුද්ගලයකු (Politically Exposed Person - PEP*) හෝ දේශපාලනිකව අනාවෘත පුද්ගලයකුට නෑකම් කියන අයෙකු වේ ද?*

- *ඔබ විසින් අයදුම් කරන ලද ජීවිත රක්ෂණාවරණයක් කිසියම් හෝ අවස්ථාවක ප්‍රතික්ෂේප වී, කල් දමා, අතිරේක වාරික අය කර හෝ බැහැර කිරීම් සහිතව පිළිගැනීම සිදුකර හෝ තිබේ ද?*

මෙම රක්ෂණ ඔප්පුවෙහි විස්තර කර ඇති නීතිරීති, කොන්දේසි, සහ බැහැර කිරීම් වලට යටත් ව, සෙලින්කෝ ලයිෆ් (මෙහි මින්මතු '**සමාගම**' යනුවෙන් හැඳින්වේ) විසින් ඔබේ සහතිකයට අදාළ ප්‍රතිලාභ ප්‍රදානය කරනු ඇත.

1.1 මෙම යෝජනාක්‍රමය ලබා දෙන්නේ, පික් මී (Pick Me) ගනුදෙනුකරුවන් (මෙහි මින්මතු '**ඔබ/ඔබේ / ජීවිත රක්ෂිතයා**' යනුවෙන් හැඳින්වේ).

1.2 එක් තනි පුද්ගලයකු සඳහා ප්‍රදානය කරනු ලබන උපරිම ජීවිත ආවරණය රු.500,000/- සඳහා සීමිත වන අතර, එය Pick Me App එක හරහා ලබාගන්නා ලද ජීවිත රක්ෂිතයා විසින් ලබාගත් රක්ෂණ ඔප්පු ගණන කෙසේ වුවද, එක් එක් අහඹු මරණ ආවරණය සහ බරපතල රෝග ආවරණය සම්බන්ධයෙන් රු. 500,000/- බැගින් සහිතව වේ.

1.3 රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමට සුදුසුකම් ලබන අවම වයස, අවුරුදු දහඅට (18) වන අතර, ජීවිත රක්ෂිතයා වයස අවුරුදු හැටපහ (65) සම්පූර්ණ කළ විට ආවරණය අවසන් වේ.

1.4 මරණ ආවරණය (හදිසි අනතුරු හැරෙන්නට වෙනත් ඕනෑම හේතුවක් මත) සහ බරපතල රෝග ආවරණය සඳහා **සහතිකය බලපැවැත්වෙන දින** සිට දින අනූව (90)ක පොරොත්තු කාලසීමාවක් අදාළ වේ. කෙසේ වෙතත්, මෙම පොරොත්තු කාලසීමාව අහඹු මරණ වලට අදාළ නොවන අතර, ගෙවීමට නියමිත දිනයේ දී හෝ සහන කාලය තුළ දී හෝ අලුත් කිරීමේ වාරිකය ජීවිත රක්ෂිතයා විසින් ගෙවනු ලබන්නේ නම් අලුත් කිරීමේ දී එය අත්හැර දැමීම සිදු කරනු ලබයි. සහන කාලය තුළ දී යම් හිමිකම් පෑමක් පැන නැගුනහොත්, හිමිකම් පෑම ගෙවනු ලබන්නේ අලුත් කිරීමේ දී අදාළ වන නොගෙවූ වාරික අඩු කරගැනීමෙන් අනතුරුව වේ.

1.5 අලුත් කිරීමේ වාරිකය නොගෙවන ලද කාලසීමාව, අලුත් කිරීම කළ යුතු දින සිට දින තිහ (30)ක් ඉක්මවා ගොස් ඇති විට රක්ෂණ ඔප්පුව අවසන් කෙරෙනු ඇති අතර, ජීවිත රක්ෂිතයා විසින් යෝජනාක්‍රමය සඳහා **නැවත-ලියාපදිංචි** වීම කළ යුතු අතර, ඉහත 1.4 වගන්තිය යටතේ සඳහන් පොරොත්තු කාලසීමාව ආරම්භ කෙරෙනුයේ, එවැනි නැවත-ලියාපදිංචි වීම සිදු කළ දින සිට වේ.

1.6 ජීවිත රක්ෂිතයාගේ මරණය සිදු වූ අවස්ථාවක දී, මරණය සිදු වී දින දාහතර (14)ක් ඇතුළත හිමිකම් පාන්නා විසින් සමාගම වෙත ඒ බව දැනුම් දී, හිමිකම් පෑමේ ලේඛන ඉදිරිපත් කළ යුතු වේ.

1.7 හිමිකම් පෑමක් සම්බන්ධයෙන් වනවිට, **ඇමුණුම 1** හි දක්වා ඇති ලේඛන සමාගම වෙත ඉදිරිපත් කළ යුතු වේ. අවශ්‍ය කෙරෙන සියලුම ලේඛන සමාගම වෙත ලැබුණු පසු, හිමිකම් පෑම සම්බන්ධයෙන් සැකසුම් කටයුතු සිදු කිරීමට සමාගම පියවර ගනු ඇත. සියලුම අවශ්‍යතාවන් සපුරාලීම සිදු කර ඇති තෙක් රක්ෂණ ඔප්පුව යටතේ කිසිදු මුදලක් ගෙවීමට නියමිත නොවන අතර, මේ සම්බන්ධයෙන් දරන්නට සිදු වන කිසියම් හෝ වියදමක් වේ නම්, එය හිමිකම් පාන්නා විසින් දැරිය යුතු වේ.

1.8 මරණය සිදු වූ අවස්ථාවේ දී, රක්ෂණ ඔප්පුවේ ප්‍රතිලාභ ලැබීම සම්බන්ධයෙන් ප්‍රතිලාභියෙකු නම් කිරීම ජීවිත රක්ෂිතයා විසින් සිදු කළ යුතු බවට අප සෑම විටෙම උපදෙස් දෙනු ලබයි. මේ සඳහා අපට ප්‍රතිලාභියාගේ ජාතික හැඳුනුම්පත් අංකය අවශ්‍ය කෙරෙයි. එවැනි නම් කිරීමක් සිදු කර නොමැති නම්, ජීවිත රක්ෂිතයාගේ මරණය සිදු වූ අවස්ථාවේ දී, ජීවිත රක්ෂිතයා විවාහකව සිටියේ නම් කලත්‍රයා වෙත ද, අවිවාහකව සිටියේ නම් දෙමාපියන් / ජීවත්ව සිටින මව හෝ පියා වෙත ද රක්ෂණ ඔප්පුවට අදාළ මරණ ප්‍රතිලාභ ගෙවීම සිදු කරනු ඇත.

1.9 නම් කළ ප්‍රතිලාභියාගේ නම පසු අවස්ථාවක දී වෙනස් කිරීමේ හැකියාව ජීවිත රක්ෂිතයා හට පවතින අතර, අවසන් වරට ලියාපදිංචි කරන ලද ප්‍රතිලාභියා, ජීවිත රක්ෂිතයාගේ මරණය සම්බන්ධයෙන් ලැබෙන ප්‍රතිලාභ වලට හිමිකම් පෑමට සුදුසුකම් ලබයි.

1.10 ජීවිත රක්ෂිතයාගේ මරණය සිදුවන්නේ, කිසියම් යුද්ධයකට හෝ යුද්ධයක් හා සමාන මෙහෙයුමකට (එම යුද්ධය ප්‍රකාශයට පත් කළ එකක් වුවද හෝ නොවුණද), සිවිල් යුද්ධයකට, බලවත් විරෝධයකට, කැරැල්ලකට, යම් ත්‍රස්තවාදී ක්‍රියාකාරකමකට, සිවිල් කැලඹීමකට, හමුදාමය හෝ බලාත්කාරයෙන් බලය පැහැර ගැනීමකට, කෝලාහලයකට,

කැරලි ගැසීමකට, ආක්‍රමණයකට, විදේශීය සතුරු ක්‍රියාවකට, හෝ නීත්‍යානුකූලව පිහිටුවන ලද කිසියම් ආධිපත්‍යයකට එරෙහි කිසියම් ක්‍රියාකාරකමකට සම්බන්ධවීමේ හෝ සහභාගිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් නම්, රක්ෂණ ඔප්පුව යටතේ කිසිදු ගෙවීමක් සිදු කිරීමේ වගකීමක් සමාගම සතු නොවේ. මෙම වගන්තිය යටතේ සමාගම වගකීමට බැඳී නොසිටින සෑම අවස්ථාවක දී ම, පැමිණිලි කර සිටින මරණය, ඉහත සඳහන් කිසිදු හේතුවක් මත සිදු නොවූවක් බවට හෝ එවැන්නක ප්‍රතිඵලයක් ලෙස සිදු නොවූවක් බවට හෝ ඔප්පු කිරීමේ වගකීම පවතිනු ඇත්තේ, මෙම රක්ෂණ ඔප්පුව යටතේ කිසියම් ප්‍රතිලාභයක් සඳහා හිමිකම් පානු ලබන පුද්ගලයා වෙත ය.

1.11 ආවරණය **අවසන් වශයෙන් ලියාපදිංචි කරන ලද දින** සිට එක් (01) වසරක් ඇතුළත ජීවිත රක්ෂිතයා මනා සිහිකල්පනාවෙන් සිටින හෝ මනා සිහිකල්පනාවෙන් නොසිටින අතරවාරයේ තමා විසින්ම තමාගේ දිවි තොර කරගත හොත්, රක්ෂණ ඔප්පුව යටතේ කිසිදු ගෙවීමක් සිදු කිරීමේ වගකීමෙන් සමාගම බැඳී නොසිටියි.

1.12 ජීවිත රක්ෂිතයාගේ මරණය, ඔහු ජීවතුන් අතර සිටියේ නම්, සාමාන්‍යයෙන් ඔහු ගැන අසන්නට ලැබෙන අය හට වසර එකක කාලයක් පුරා ඔහු ගැන අසන්නට නොලැබුණු තත්ත්වයන් යටතේ සිදු ව ඇති මරණයක් බවට උපකල්පනය කරන පදනමක් යටතේ පිළිගැනීමට සිදු වන අවස්ථාවක දී, ජීවිත රක්ෂිතයා ගැන අසන්නට නොලැබුණු සහ මෙම කරුණ සමාගම වෙත දැනුම් දෙන ලද අවස්ථාවේ සිට ගණනය කරනු ලබන **වසර 07** ක කාලයක් ගෙවී යන තෙක් මෙම රක්ෂණ ඔප්පුව යටතේ කිසිදු මුදලක් ගෙවීමට නියමිත නොවේ.

1.13 ලබාගත හැකි වෛද්‍යමය සාක්ෂි මත පදනම්ව, ජීවිත රක්ෂිතයාගේ මරණයට සෘජුව හෝ වක්‍රව හෝ හේතු වී ඇත්තේ පරිශිත ප්‍රතිශක්ති ඌණතා සහලක්ෂණය (ඒඩ්ස්) (Acquired Immune Deficiency Syndrome - AIDS) හෝ ඕනෑම මානව ප්‍රතිශක්ති ඌනතාකාරක වෛරසයක් (Human Immunodeficiency Virus - HIV) බවට පිළිගැනුණහොත්, මෙම රක්ෂණ ඔප්පුව යටතේ කිසිදු ප්‍රතිලාභයක් ගෙවනු නොලැබේ.

1.14 මෙම රක්ෂණ ඔප්පුවට කිසිදු පවාරණ අගයක් හිමි නොවේ.

1.15 මෙම රක්ෂණ ඔප්පුව යටතේ කිසිදු කල්පිරීමේ ප්‍රතිලාභයක් හිමි නොවේ.

1.16 මෙම රක්ෂණ ඔප්පුව යටතේ වන සියලුම වාරික සහ ප්‍රතිලාභ ගෙවනු ලබන්නේ ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල ව්‍යවහාරික මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

1.17 ප්‍රකාශනයෙහි සැලකිය යුතු කරුණු හෙළිදරව් නොකිරීම මත හෝ යම් අසත්‍ය, සාවද්‍ය සම්ප්‍රකාශ අඩංගු කිරීම මත හෝ හිමිකම් පෑමක් ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, රක්ෂණ ඔප්පුව අවලංගු කෙරෙන අතර, රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් ගෙවන ලද සියලුම වාරික අහිමි වීම / සින්න වීම සිදු වනු ඇත.

2. අහඹු මරණ පිළිබඳ ප්‍රතිලාභ (ACCIDENTAL DEATH BENEFIT)

2.1 ප්‍රතිලාභ (BENEFIT)

හදිසි අනතුරක් හේතුවෙන් මරණය සිදු වූ අවස්ථාවක, රක්ෂණ සහතිකයේ දක්වා ඇති අහඹු මරණ ප්‍රතිලාභ (මරණය පිළිබඳ ප්‍රතිලාභයට අමතරව) ගෙවීම සිදු කරනු ලබන්නේ මෙහි අඩංගු නීතිරීති, කොන්දේසි සහ බැහැරකිරීම් වලට යටත් ව වේ.

2.2 නිර්වචන (DEFINITIONS)

<u>අහඹු මරණ (ACCIDENTAL DEATH)</u>:
එක එල්ලේම හදිසි අනතුරක් නිසාම තදබල ලෙස හා බාහිරව ද දෘශ්‍යමානව ද, ශාරීරික තුවාල ලබා ඒ තුවාල හේතුන් පමණක් මුල් වී එබඳු තුවාල ලැබූ දින සිට දින අනූව (90)ක් ඇතුළත වෙනත් බාහිර හේතුන් කිසිවක් සම්බන්ධ නොවී එක එල්ලේම එබඳු තුවාල නිසාම ජීවිත රක්ෂිතයාගේ මරණය සිදු වුවහොත්, එය අහඹු මරණයක් වශයෙන් සමාගම විසින් සලකනු ඇත.

<u>හදිසි අනතුර (ACCIDENT)</u>: හදිසි අනතුරක් යන්නෙන් අදහස් වන්නේ, බාහිර වශයෙන් දෘශ්‍යමාන වන සහ ප්‍රචණ්ඩකාරී ආකාරයන්ගෙන් සිදුවන හදිසි, අනපේක්ෂිත සහ තමා විසින්ම සිදු කර නොගත්තා වූ සිදු වීමකි.

<u>තුවාල (INJURY)</u>: තුවාල යන්නෙන් අදහස් වන්නේ, වෛද්‍ය වෘත්තිකයකු විසින් සනාථ කරන ලද සහ තහවුරු කරන ලද බාහිර, ප්‍රචණ්ඩකාරී, දෘශ්‍යමාන සහ පැහැදිලි ආකාරයන් හේතුවෙන් සම්පූර්ණයෙන්ම සහ සෘජුවම හදිසි අනතුරක් හේතුවෙන් සිදු ව ඇති ශාරීරික හානියක් වන අතර, රෝගී තත්ත්වයන් සහ රෝගාබාධ ඊට අයත් නොවේ.

2.3 අහඹු මරණ ආවරණයට අදාළ වන බැහැර කිරීම් (EXCLUSIONS APPLICABLE TO ACCIDENTAL DEATH COVER)

පහත දැක්වෙන තත්ත්වයන් යටතේ ජීවිත රක්ෂිතයාගේ මරණය සිදු වුවහොත්, අහඹු මරණ ආවරණය යටතේ කිසිදු ගෙවීමක් සිදු කිරීමේ වගකීමෙන් සමාගම බැඳී නොමැතː

(a) හිතා-මතා තමාටම තුවාල සිදු කරගැනීම, සිය දිවි තොර කරගැනීම හෝ සිය දිවි තොර කරගැනීමට තැත් කිරීම, උමතු බවට පත් වීම, දුරාචාරය හෝ ජීවිත රක්ෂිතයා විසින් මත්පැන්, මත්ද්‍රව්‍ය හෝ වේදනානාශක වලින් මත්ව සිටීමේ බලපෑමට ලක්ව සිටින විට.

(b) ගාස්තු-ගෙවීම සිදු කළ, අර්ධ-ගෙවීම් සිදු කළ මගීන්, පිළිගත් ගුවන් තොටුපළ අතර රැගෙන යාමට සහ ගුවනින් ගෙන යාමට අදාළ රෙගුලාසි මගින් බලය පවරා ඇති ඕනෑම ගුවන් යානයක සිටින එවැනි මගීන් නොවන්නා වූ වෙනත් ඕනෑම තත්ත්වයක් යටතේ ගුවන් සේවා හෝ ගගනයාත්‍රා විද්‍යාවේ කිසියම් කටයුත්තක නිරතව සිටින අවස්ථාවක හදිසි අනතුරක් සිදු වූ විට.

(c) කිසියම් යුද්ධයකට හෝ යුද්ධයක් හා සමාන මෙහෙයුමකට (එම යුද්ධය ප්‍රකාශයට පත් කළ එකක් වුවද හෝ නොවුණද), සිවිල් යුද්ධයකට, බලවත් විරෝධයකට, කැරැල්ලකට, යම් ත්‍රස්තවාදී ක්‍රියාකාරකමකට, සිවිල් කැලඹීමකට, හමුදාමය හෝ බලාත්කාරයෙන් බලය පැහැර ගැනීමකට, කෝලාහලයකට, කැරලි ගැසීමකට, ආක්‍රමණයකට, විදේශීය සතුරු ක්‍රියාවකට, හෝ නීත්‍යානුකූලව පිහිටුවන ලද කිසියම් ආධිපත්‍යයකට එරෙහි හෝ වැඩ වර්ජන හෝ සේවකයන් පිටගුලු ලෑමේ කිසියම් ක්‍රියාකාරකමකට සම්බන්ධවීමේ හෝ සහභාගිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් තුවාල සිදු වූ විට.

(d) හමුදාමය, නාවික, ගුවන් හමුදා, පොලිසිය හෝ සමාන රෙජිමේන්තු බලකායක හෝ සංවිධානයක ක්‍රියාකාරී කටයුතු වල නියැලීම නිසා ජීවිත රක්ෂිතයාට තුවාල සිදු වූ විට.

(e) කිසියම් නීතියක් උල්ලංඝනය කිරීමක දී, කිසියම් සාපරාධී ක්‍රියාවක් සිදු කිරීමට සහභාගි වීමක දී හෝ තැත් කිරීමක දී, අත්අඩංගුවට පත් කිරීමට විරෝධය දැක්වීමක දී හෝ රක්ෂිතයාගේ ඕනෑම සාමාජිකයකු විසින් ඇති කරන ලද ප්‍රකෝපකාරී පහරදීමක දී හෝ ඍජුව හෝ වක්‍රව හෝ තුවාල සිදු වූ විට.

(f) දඩයමේ නිරත වීමේ දී, කඳු තරණය කිරීමේ දී හෝ දිවීමේ දී හෝ, නමුත් ඊට සහභාගි වීම පිණිස පයින් ගමන් කිරීමක දී හෝ පුහුණු වීමක දී හෝ හැරෙන්නට, සහ ඕනෑම ආකාරයක කිමිදීමක දී හෝ දිය යට හෝ පොළොව යට හෝ නිරත වන කිසියම් මෙහෙයුමකට සම්බන්ධ වීමේ දී එහි ප්‍රතිඵලයක් වශයෙන් තුවාල සිදු වූ හෝ ඇති වූ විට.

(g) න්‍යෂ්ටික දූෂණය; න්‍යෂ්ටික ඉන්ධන ද්‍රව්‍ය වල විකිරණශීලී, පුපුරනසුලු, අන්තරායකාරී ස්වාභාවය හෝ න්‍යෂ්ටික ඉන්ධන ද්‍රව්‍ය මගින් අපවිත්‍ර වූ දෑ හෝ එවැනි ස්වාභාවයකින් හදිසි අනතුරු පැන නැගුන විට.

3. අසාධ්‍ය රෝග ආවරණය (CRITICAL ILLNESS COVER)

3.1 ප්‍රතිලාභ (BENEFIT)

පහත නිශ්චිතව දක්වා ඇති අසාධ්‍ය රෝගයක් සම්බන්ධයෙන් ජීවිත රක්ෂිතයා පළමු වතාවට ශල්‍යකර්මයකට භාජනය වී ඇති බවට රෝග විනිශ්චයක් සිදු කර ඇති විටෙක දී, රක්ෂණ සහතිකයේ දක්වා ඇති මුදල සමාගම විසින් ගෙවනු ලබන්නේ, එකී රෝගය වැළඳී ඇත්තේ සහතිකය බලපැවැත්වෙන වන දිනයේ සිට දින අනූව (90)ක් ඇතුළත දී නොවන අවස්ථාවක දී ය.

3.2 අසාධ්‍ය රෝග පිළිබඳ නිර්වචන (DEFINITIONS OF CRITICAL ILLNESSES)

මෙම රක්ෂණ ඔප්පුවේ **වගන්ති 3.3 සහ 3.4** යටතේ සඳහන් කර ඇති කොන්දේසි සහ බැහැර කිරීම් වලට යටත් ව, පහත අර්ථ නිරූපණය කරන ලද අසාධ්‍ය රෝග මෙම ප්‍රතිලාභය යටතේ ආවරණය කර ඇත.

i. පිළිකාව (Cancer)

සාමාන්‍ය පටක ආක්‍රමණය කරමින්, හා විනාශයට පත් කරමින්, පාලනය කළ නොහැකි අන්දමින් මාරාන්තික සෛල වර්ධනය වීම හා පැතිරීම පෙන්නුම් කෙරෙන මාරාන්තික ගෙඩියකි (පටක වල අසාමාන්‍ය වැඩීමකි). මාරාන්තික සෛල වල වර්ධනය පිළිබඳ පේශී විද්‍යානුකූල සාක්ෂි (histological evidence of malignancy) වල සහය මෙකී රෝග විනිශ්චය සතු විය යුතු වේ. පිළිකා යන යෙදුමට ලියුකේමියා, ලිම්ෆෝමා (වසා ගැටිති වල හට ගන්නා අර්බුදයකි) සහ සාකෝර්මා (පටක වල සෑදෙන වායු ගෙඩි) යන වචන ද ඇතුළත් වේ.

පහත සඳහන් කරුණු මීට ඇතුළත් නොවේ:

- පේශී විද්‍යානුකූල කාසිනෝමා (අභ්‍යන්තරික පිළිකා) වශයෙන් විස්තර කෙරෙන අභ්‍යන්තරික, හිංසාකාරී නොවන, පූර්ව-මාරාන්තික, මාරාන්තික වීමේ සීමාවෙහි පවතින, මාරාන්තික බවින් අඩු විය හැකි, හඳුනා නොගත් චර්යාවන් සහිත නියෝප්ලාස්ම, හෝ පියයුරු, ගැබ්ගෙල ඩිස්ප්ලාසියාව, CIN-1, CIN - 2 සහ CIN-3 ද ඇතුළත්ව ඊට සීමා නොවුණු ආක්‍රමණශීලී නොවන සියලුම ගෙඩි (tumors);
- වසා ගැටිති වලට හෝ ඉන් ඔබ්බට ගොස් ඇති ද්විතීයික ගෙඩි (metastases) පිළිබඳ සාක්ෂි පැවතියහොත් මිස, මෙලනෝමා-නොවන ඕනෑම චර්ම කාසිනෝමා තත්ත්වයක්;
- අපිචර්මයෙන් (epidermis) ඔබ්බට ආක්‍රමණය කර නොමැති මාරාන්තික මෙලනෝමා (සමේ පිළිකා වර්ගයකි);
- ග්ලීසන් ලකුණු ප්‍රමාණය 6 වැඩියෙන් පවතින බවට හෝ සායනික TNM වර්ගීකරණය අවම වශයෙන් T2N0M0 තෙක් වර්ධනය වී ඇති බවට හෝ පේශී විද්‍යානුකූලව වර්ගීකරණය කර නොමැති නම් මිස, පුරස්ථි ග්‍රන්ථියෙහි වන සියලුම ගෙඩි;
- පේශී විද්‍යානුකූලව T1N0M0 (TNM වර්ගීකරණය) වශයෙන් හෝ ඊට අඩු ලෙසට වර්ගීකරණය කරන ලද සියලුම තයිරොයිඩ් ග්‍රන්ථි පිළිකා;
- 3 ට අඩු RAI අදියරයෙන් යුතු නිදන්ගත ලිම්ෆොසයිටික් ලියුකේමියාව;
- පේශී විද්‍යානුකූලව TaN0M0 හෝ ඊට අඩු වර්ගීකරණයක් ලෙසට විස්තර කර ඇති, මුත්‍රාශයේ හට ගන්නා ආක්‍රමණශීලී-නොවන පැපිලරි පිළිකාව;
- පේශී විද්‍යානුකූලව T1N0M0 (TNM වර්ගීකරණය) හෝ ඊට අඩු වර්ගීකරණයක් ලෙසට විස්තර කර ඇති, සහ මයිටොටික් ගණන ට අඩු හෝ 5/50 HPFs දක්වා ඊට සමාන වූ සියලුම ආමාශයික-ස්ට්‍රෝමල් ගෙඩි;
- HIV ආසාදනය සමග දක්නට ලැබෙන සියලුම ගෙඩි (අසාමාන්‍ය පටක වැඩීම්).

ii. මයෝකාඩියල් ඉන්ෆාක්ෂන් (Myocardial Infarction)

අදාළ හෘද කොටසට ප්‍රමාණවත් රුධිර සැපයුමක් නොලැබීම හේතුවෙන් හෘද පේශියේ කොටසක් ක්‍රියා විරහිත වීම අදහස් කෙරෙන හෘදයාබාධය හෝ මයෝකාඩියල් ඉන්ෆාක්ෂන් **ප්‍රථම වතාවට** ඇති වීම. මයෝකාඩියල් ඉන්ෆාක්ෂන් රෝග විනිශ්චයේ දී පහත සියලුම නිර්ණායකයන් මගින් සාක්ෂි සැපයිය යුතු වේ:

(i) උග්‍ර මයෝකාඩියල් ඉන්ෆාක්ෂන් (උදා: ආවේණික පපුවේ වේදනාව) සමග ආවේණික සායනික රෝග ලක්ෂණ පිළිබඳ ඉතිහාසයක්.

(ii) නව ලාක්ෂණික විද්‍යුත් කන්තුක රේඛනයේ (electrocardiogram) වෙනස්කම්.

Classification | Internal Use Only
Classification | Confidential–External

(iii) ඉන්ෆාක්ෂන් නිශ්චිත එන්සයිම, ට්‍රොපොනින් හෝ වෙනත් නිශ්චිත ජීව-රසායනික ද්‍රව්‍යවල ඉහළ නැගීම්.

පහත සඳහන් කරුණු මීට ඇතුළත් නොවේ:

(i) අනෙකුත් උග්‍ර කිරීටක සින්ඩ්‍රෝමයන් (Acute Coronary Syndromes).

(ii) ඕනෑම ආකාරයක උරස් සම්බාධයන් (Angina Pectoris).

(iii) ඉස්කීමික් හෘද රෝගය පෙනෙන්නට නොමැති විටෙක (Overt ischemic heart disease) හෝ අභ්‍යන්තර-ධමනී හෘද සැත්කමකට (Intra-arterial cardiac procedure) පසුව හෝ හෘද එන්සයිම හෝ ට්‍රොපොනින් T හෝ I ඉහළ යාම.

iii. ආඝාතය (Stroke)

පහත කරුණු සහිත වූ, අන්තහ්කපාල ත්‍රොම්බොසිස් (intracranial thrombosis) හෝ රුධිර වහනය වීමක් {උප-ලෞතාහ රුධිර වහනය වීමක් (subarachnoid haemorrhage) ද ඇතුළුව}, හෝ බහිර්කපාල ඇහිරීමක් හේතුවෙන් සිදු වූ උග්‍ර මස්තිෂ්ක වාහිනී ආබාධයක් නිසා මොළයේ පටක අක්‍රීය වීම:

- නව ස්නායු රෝග ලක්ෂණ උග්‍ර අන්දමින් ආරම්භ වීම, සහ
- සායනික පරීක්ෂණයේ දී නව වෛෂයික ස්නායු ඌනතා ඇති වීම.

රෝගය විනිශ්චය කිරීමේ දින සිට මාස 3ක ට වැඩි කාලයක් එකී ස්නායු ඌනතාව පැවතිය යුතු ය. ස්නායු පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් රෝග විනිශ්චය තහවුරු කළ යුතු අතර, එය රූපමය වශයෙන් සොයා ගැනුණු (එක්ස්-රේ, සීටී ස්කෑන් හෝ එම්ආර්අයි වැනි) කරුණු මගින් සනාථ කළ යුතු වේ.

ඉහත නිර්වචනය මගින් පහත දෑ ආවරණය නොවේ:

- තාවකාලික ස්නායු ඌනතා (Transient Ischaemic Attack - TIA) සහ යථා තත්ත්වයට පත් කළ හැකි දිගු-කාලීන ස්නායු ඌනතා (Prolonged Reversible Ischaemic Neurological Deficit - PRIND);
- මොළයේ පටක හෝ රුධිර නාල වලට සිදු වන කම්පන සහගත මොළයේ තුවාල (traumatic injury);
- සාමාන්‍ය හයිපොක්සියා, ආසාදන, ඉදිමුම් ඇති කෙරෙන රෝග, මිග්‍රේන් හෝ වෛද්‍යමය මැදිහත් වීම් හේතුවෙන් ඇති වන ස්නායු ආශ්‍රිත ඌනතා.

- පැහැදිලිවම ආශ්‍රිත සායනික රෝග ලක්ෂණ වලින් තොරව (නිහඬ ආඝාතය), අහඹු, රූපමය වශයෙන් සොයා ගැනුණු (එක්ස්-රේ, සීටී ස්කෑන් හෝ එම්ආර්අයි වැනි) තත්ත්වයක්.

iv. කිරීටක ධමනි ආශ්‍රිත ශල්‍යකර්ම (Coronary Artery Surgery)

අතුරුමං බද්ධ කිරීම (bypass grafting) මගින් කිරීටක ධමනි 1ක් හෝ ඊට වැඩි ගණනක් සිහින් වීම හෝ අවහිර වීම නැති කිරීම පිණිස (උරස් කුහරය විවෘත කර) සැබැවින්ම ශල්‍යකර්මයක් සිදු කරවා ගැනීම හෝ උරස් කුහරය විවෘත කිරීමකින් තොර අවම ආක්‍රමණයක් සහිත කිරීටක ධමනි අතුරුමං බද්ධ කිරීම (keyhole coronary artery bypass procedures). මෙම රෝග විනිශ්චය කිරීටක ඇන්ජියෝග්‍රැෆි පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතු වන අතර, ශල්‍යකර්මයක් සිදු කළ යුතු බවට හෘද රෝග විශේෂඥයකු විසින් සනාථ කිරීම ද කළ යුතු වේ.

පහත සඳහන් කරුණු මීට ඇතුළත් නොවේ:

- උරස් කුහරය විවෘත කිරීමෙන් තොරව සිදු කරන සහ/හෝ වෙනත් අභ්‍යන්තර-ධමනී හෘද සැත්කම් (Intra-arterial cardiac procedures).

v. වකුගඩු ක්‍රියා විරහිත වීම (Renal Failure)

නිතිපතා හීමෝඩයලිසිස් රක්ත කාන්දු පෙරීම හෝ පරිනාත කාන්දු පෙරීම හෝ වකුගඩු බද්ධ කිරීම හේතුවෙන් කල්ගත වූ සහ නැවත යථා තත්ත්වයට පත් නොවන වකුගඩු දෙක ම ක්‍රියා විරහිත වීම. කාන්දු පෙරීම වෛද්‍යමය වශයෙන් අවශ්‍ය විය යුතු වන අතර, එය වකුගඩු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකු විසින් සනාථ කර තිබිය යුතු ය.

ඉහත නිර්වචනය මගින් පහත දෑ ආවරණය නොවේ:

- තාවකාලික වකුගඩු කාන්දු පෙරීම සහිත උග්‍ර, යථා තත්ත්වයට පත් කළ හැකි වකුගඩු අක්‍රීය වීම.

vi. ප්‍රධාන අවයව බද්ධ කිරීම (Major Organ Transplant)

ප්‍රතිග්‍රාහකයකු ලෙස, පහත සඳහන් අවයව වලින් එකක් හෝ ඊට වැඩි ගණනක ඇලොග්‍රාෆ්ට් (ජානමය වශයෙන් එක හා සමාන දෙදෙනෙකු අතර කෙරෙන පටක බද්ධ කිරීමක්) හෝ අයිසොග්‍රාෆ්ට් (ජානමය වශයෙන් එක හා සමාන නොවන දෙදෙනෙකු අතර කෙරෙන පටක බද්ධ කිරීමක්) අවයව බද්ධ කිරීමකට භාජනය වීම:

- හෘදය වස්තුව
- වකුගඩු

- අක්මාව (එකම අක්මාව දෙකට බෙදාගත් සහ දායකයකු වෙතින් ලද අක්මාවක් බද්ධ කිරීම ද ඇතුළුව).
- පෙනහැල්ල (සුජීවත් දායකයකු වෙතින් පෙනහැල්ලේ එක් කොටසක් බද්ධ කිරීම හෝ තනි-පෙනහැල්ලක් බද්ධ කිරීම ද ඇතුළුව).
- ඇටමිදුළු (සමස්ත ඇටමිදුළු ගෙවී ඇති බවට පූර්ව-නිගමනය කිරීම නිසා ජානමය වශයෙන් ගැළපෙන දායකයකුගේ ඇටමිදුළු වලින් ලබාගත් නිරෝගී සහ රුධිරය උපදවන ප්‍රාථමික සෛල බද්ධ කිරීම) ؛allogeneic hematopoietic stem cell transplantation).
- කුඩා අන්ත්‍රය
- අග්න්‍යාශය

අර්ධ හෝ සම්පූර්ණ මුහුණ, අත, බාහුව සහ පාදය බද්ධ කිරීම (ජානමය වශයෙන් එක හා සමාන දෙදෙනෙකු අතර කෙරෙන සංයුක්ත පටක බද්ධ කිරීමක්) ද මෙම නිර්වචනය යටතේ ආවරණය කෙරෙයි. විශේෂඥ වෛද්‍යවරයකු විසින් තහවුරු කළ පරිදි, වෙනත් කිසිදු ආකාරයකින් ප්‍රතිකාර කළ නොහැකි බවට සලකන බැවින් බද්ධ කිරීමට සිදු විය යුතු වේ.

ඉහත නිර්වචනය මගින් පහත දෑ ආවරණය නොවේ:

- වෙනත් අවයව, ශරීර කොටස් හෝ පටක (ඇසේ සුදු ඉංගිරියාව සහ සම ද ඇතුළුව).
- වෙනත් සෛල බද්ධ කිරීම {රක්තපාත සෛල හැර, හෝමෝන නිපදවන අග්න්‍යාශයේ සෛල (islet cells) සහ ප්‍රාථමික සෛල (stem cells) ද ඇතුළුව}.

3.3 අසාධ්‍ය රෝග ආවරණය සඳහා අදාළ කොන්දේසි (CONDITIONS APPLICABLE TO CRITICAL ILLNESS COVER)

මෙම ප්‍රතිලාභයට, පහත දක්වා ඇති කොන්දේසි අදාළ වේ.

(i) අසාධ්‍ය රෝගය විනිශ්චය කළ යුත්තේ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු සහ/හෝ සමාගම විසින් පත් කරන ලද වෛද්‍ය වෘත්තිකයකු විසින් වන අතර, සමාගමට පිළිගත හැකි සායනික, විකිරණ විද්‍යානුකූල, පේශී විද්‍යානුකූල සහ රසායනාගාර සාක්ෂි මගින් එය තහවුරු විය යුතු වේ. එකී වෛද්‍යමය සාක්ෂි ඉදිරිපත් කළ යුතු වන්නේ රක්ෂිතයාගේ වියදමිනි.

(ii) මෙම රක්ෂණ ඔප්පුව යටතේ අසාධ්‍ය රෝගයක් සඳහා හිමිකම් පෑමක් ගෙවනු ලැබුවේ නම්, මෙම රක්ෂණ ඔප්පුව අවසන් කෙරෙයි.

(iii) නිර්වචනය කර ඇති රෝගාබාධයකින් ජීවිත රක්ෂිතයා පෙළෙයි නම්, වහාම හෝ ප්‍රායෝගිකව හැකි වූ වහාම නමුත් එකී රෝගය වැළඳුණු දින සිට දින දාහතර (14)ක්

ඉක්මීමට පෙරාතුව ඒ බව සමාගම වෙත දැන්විය යුතු වේ. එසේ නොවුණහොත්, අසාධ්‍ය රෝගයක් සඳහා වන ගෙවීම් සම්බන්ධයෙන් සමාගම වගවිය යුතු නොවේ.

3.4 අසාධ්‍ය රෝග ආවරණය සඳහා අදාළ වන බැහැර කිරීම් (EXCLUSIONS APPLICABLE TO CRITICAL ILLNESS COVER)

ආවරණය කරන ලද අසාධ්‍ය රෝගයක් පහතින් දක්වා ඇති ඕනෑම හේතුවක ප්‍රතිඵලයක් වශයෙන් සෘජුව හෝ වක්‍රව හෝ ඇති වුවහොත් හෝ සහතිකය බලපැවැත්වෙන දින සිට පොරොත්තු කාලසීමාව තුළ ඇති වුවහොත්, ජීවිත රක්ෂිතයා හට කිසිදු ප්‍රතිලාභයක් හිමි නොවේ. ආවරණය කළ එක් එක් අසාධ්‍ය රෝගාබාධ සඳහා වන අර්ථ නිරූපණයන් හි නිශ්චිතව දක්වා ඇති බැහැර කිරීම් වලට අමතරව, මෙකී බැහැර කිරීම් අදාළ වේ.

1. **පෙර-සිට පැවති රෝගාබාධ**: පෙර-සිට පැවති රෝගාබාධය අර්ථ නිරූපණය කර ඇත්තේ, ඔබට ලකුණු පහළ ව තිබූ හෝ රෝග ලක්ෂණ පැවති සහ/හෝ රෝග විනිශ්චය කරන ලද, සහ/හෝ රක්ෂකයා විසින් පළමු රක්ෂණ ඔප්පුව නිකුත් කිරීමට පෙරාතුව සහ ඉන් අනතුරුව අඛණ්ඩව අලුත් කිරීමට පෙරාතුව වෛද්‍ය උපදෙස් / ප්‍රතිකාර ලද ඕනෑම තත්ත්වයක්, රෝගයක් හෝ තුවාල වීමක් හෝ ආශ්‍රිත තත්ත්ව (තත්ත්වයක්) වේ.

2. HIV හෝ AIDS ආසාදනයක් හෝ ලිංගිකව සම්ප්‍රේෂණය වූ වෙනත් යම් රෝගයක් පවතින විට ඇති වන රෝගාබාධ;

3. යම් අසාධ්‍ය රෝගයක් සඳහා වෛද්‍ය විශේෂඥයකු විසින් නිර්දේශිත හෝ වෙතින් ලද හෝ සාත්තුව, ප්‍රතිකාර, හෝ උපදෙස්, අසාධ්‍ය රෝග සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව, ඒ මත පදනම් ව, එමගින් පැන නැගුණු හෝ කුමනාකාරයේ හෝ ඕනෑම හිමිකම් පෑමක්;

4. හිතා-මතා තමාටම තුවාල සිදු කරගැනීම, සිහිබුද්ධියෙන් සිටිය දී හෝ උමතුව සිටිය දී හෝ සියදිවි තොර කරගැනීමට තැත් කිරීම;

5. ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකුගේ නීත්‍යානුකූල උපදෙස් හෝ බෙහෙත් වට්ටෝරුවට අනුව ලබාගෙන ඇත්නම් මිස, රක්ෂිත පුද්ගලයා මත්ද්‍රව්‍ය, මත්පැන්, වේදනානාශක හෝ සංජානනය, මනෝභාව, හෝ හැසිරීම වෙනස් කෙරෙන අන්දමින් මොළයට බලපාන ද්‍රව්‍ය (pschotropic substances) වල බලපෑමට ලක්ව සිටීම;

6. පිළිගත් ගුවන් සමාගමක, නිතිපතා සහ සැලසුම් කළ කාලසටහනකට අනුව නිතිපතා ගුවන් මාර්ග වල නිර්ව්‍යාජ, ගාස්තු-ගෙවූ මගියකු වශයෙන් ගමන් ගන්නා යම් ක්‍රියාකාරමකට රක්ෂිත පුද්ගලයා සහභාගි වීම;

7. සාපරාධී හෝ නීති විරෝධී ක්‍රියාකාරකමකට රක්ෂිත පුද්ගලයා සහභාගි වීම;

8. කිමිදීම, පැදවීම හෝ ඕනෑම ආකාරයක ධාවන තරග; ශ්වසන උපකරණ භාවිත කරමින් හෝ නොකරමින් හෝ දිය යට සිදු කරන ක්‍රියාකාරකම්; සටන් කලා; දඩයමේ යාම්; කඳු තරණය කිරීම්; පැරෂුට් කිරීම්; ආරක්ෂාවට බන්ජි-ලණුවක් පය බැඳ කරන පැනීම් (bungee-jumping) ඇතුළුව නමුත් ඊට සීමා නොවී, වෘත්තීමය ක්‍රීඩාවක් (ක්‍රීඩා) හෝ අන්තරායකාරී කාර්යයන් කිසිවකට හෝ සම්බන්ධ වීම හෝ සහභාගි වීම;

9. න්‍යෂ්ටික අපවිත්‍රණය; න්‍යෂ්ටික ඉන්ධන ද්‍රව්‍ය වල හෝ එවැනි දෑ වල විකිරණශීලී, පුපුරනසුලු හෝ අන්තරායකාරී ස්වාභාවය මගින් අපවිත්‍රණය වූ න්‍යෂ්ටික ඉන්ධන ද්‍රව්‍ය මගින් හෝ එවැනි ස්වාභාවයන් මගින් හෝ පැන නගින හදිසි අනතුරු;

10. මානසික රෝග, පශ්චාත්-කම්පන ආතති ආබාධ, නිදන්ගත තෙහෙට්ටුව, නිදන්ගත වේදනා සහ ෆයිබ්‍රොමියල්ජියා (දිගුකල් පවතින හා බොහෝ සේ පැතිරුණු ශාරීරික වේදනා) මෙයින් බැහැර කෙරෙයි;

11. උපතින්ම හට ගත් යම් විෂමතාවක්;

12. "වෛද්‍ය උපදෙස්" යන්නෙන්, කිසියම් බෙහෙත් වට්ටෝරුවක් නිකුත් කිරීම හෝ පසු-විපරම් වට්ටෝරුවක් නිකුත් කිරීම ද ඇතුළුව වෛද්‍ය වෘත්තිකයකු වෙතින් යම් උපදේශනයක් හෝ උපදෙසක් හෝ අදහස් කෙරෙන අවස්ථාවක, වෛද්‍ය උපදෙස් ලබාගැනීමට හෝ අනුගමනය කිරීමට හෝ අපොහොසත් වීම.

ඇමුණුම 1 (ANNEXURE 1)

හිමිකම් පෑම සිදු කිරීමට අදාළ වූ සිද්ධිය සිදුවීමෙන් අනතුරුව, රක්ෂණ ඔප්පුවේ දක්වා ඇති දින වකවානු ඇතුළත දී ජීවිත රක්ෂිතයා /හිමිකම් පාන්නා විසින් හිමිකම් පෑම පිළිබඳ දැනුම්දීමක් (ලිඛිතව හෝ අන්‍යාකාරයෙන් හෝ) ලබා දිය යුතු වේ.

හිමිකම් පෑම ගැන දැනුම් දීම, පහත දක්වා ඇති ඕනෑම ආකාරයකින් සිදු කළ හැකිය:

- දුරකථන හරහා: 0112 461 461
- විද්‍යුත් තැපැල් හරහා: care@ceylife.lk, service@ceylife.lk
- වට්ස්ඇප් / වයිබර් හරහා: 0775 776 556
- තැපැල් මගින්: හිමිකම් පෑම්, අංක 106, හැව්ලොක් පාර, කොළඹ 05
- සමාගමේ වෙබ්අඩවිය හරහා: www.ceylincolife.com

හිමිකම් පෑමට අදාළ වූ සිදුවීම පිළිබඳ තත්ත්වයන් සහ හේතු ගැන අවශ්‍ය විමසීම් සමාගම විසින් සිදු කිරීමට ජීවිත රක්ෂිතයා / හිමිකම් පාන්නා ඉඩ ලබා දිය යුතු වේ. මෙම රක්ෂණ ඔප්පුව යටතේ යම් හිමිකම් පෑමක්, පවාරණයක් හෝ මුදල් ආපසු ඉවත් කරගැනීමක් පිළිගැනීම උදෙසා, ජීවිත රක්ෂිතයා / හිමිකම් පාන්නා විසින් වෛද්‍යමය, නීතිමය හෝ අන්‍යාකාරයෙන් වන එවැනි සාක්ෂි සමාගම වෙත සැපයීමට බැඳී සිටිය යුතු වේ.

මෙම රක්ෂණ ඔප්පුව යටතේ වන ඕනෑම ප්‍රතිලාභයක් ගෙවීමට පෙරාතුව, ඕනෑම හිමිකම් පෑමක් විමර්ශනය කිරීමේ සහ හිමිකම් පෑමේ තත්ත්වයන් ආශ්‍රිත ඕනෑම ලේඛනයක් ලබාගැනීමේ අයිතිය සමාගමට පවතියි. හිමිකම් පෑම තක්සේරු කිරීම සිදු කරන අතරතුර සමාගම විසින් ඉල්ලා සිටින සියලුම තොරතුරු සහ ලේඛන ජීවිත රක්ෂිතයා / හිමිකම් පාන්නා විසින් ලබාදෙන තුරු මෙම රක්ෂණ ඔප්පුව යටතේ කිසිදු ගෙවීමක් සමාගම විසින් සිදු නොකරනු ඇත.

විශේෂයෙන්ම, රක්ෂණ ඔප්පුව යටතේ වන කිසියම් ප්‍රතිලාභයක් ගෙවීමට පෙරාතුව, පහත දක්වා ඇති ලේඛන (හිමිකම් පෑමේ ස්වාභාවයට අනුව අදාළ වනවිට) සමාගම වෙත ඉදිරිපත් කළ යුතු වේ.

මරණ පිළිබඳ හිමිකම් පෑම් (Death Claims)

- හිමිකම් පාන්නාගේ ප්‍රකාශය
- මරණ සහතිකය
- රෝහල් ගත කර සිටියේ නම් හෝ දිගු-කාලීන රෝගාබාධ හේතුවෙන් මරණයට පත් වූයේ නම් හෝ මරණය සිදු වූබවට වන වෛද්‍ය සහතිකය (Death Claim Medical Certificate) (සමග පෙර-තිබූ රෝග නිශ්චය කිරීමේ කාඩ්පත්, ප්‍රතිකාර පිළිබඳ වාර්තා ආදිය).
- හදිසි / අහඹු මරණයක දී, මරණ පරීක්ෂකගේ මරණ පරීක්ෂණය/ මහෙස්ත්‍රාත් පරීක්ෂණය / පශ්චාත් මරණ පරීක්ෂණය (මෙකී වාර්තා ලබාගත යුත්තේ මහෙස්ත්‍රාත් අධිකරණය වෙතින් ය).
- මියගිය රක්ෂණ ඔප්පු හිමිකරු සහ ප්‍රතිලාභීන් හඳුනාගැනීම සඳහා වන අනෙකුත් ආශ්‍රිත ලේඛන.

අසාධ්‍ය රෝග (Critical Illness)

- හිමිකම් පාන්නාගේ ප්‍රකාශය.

Classification | Internal Use Only
Classification | Confidential–External

- රෝගයට අනුව වන වෛද්‍ය සහතිකය (රක්ෂණ ඔප්පුව මගින් ආවරණය කර ඇති එක් එක් සහ සෑම අසාධ්‍ය රෝගයක්ම සම්බන්ධවෙන් වෙන වෙනම පවතින වෛද්‍ය වාර්තා).
- රෝග විනිශ්චය කාඩ්පත සහ වෙනත් විශේෂ විමර්ශන වාර්තා (කරුණාකර රක්ෂණ ඔප්පුවේ අර්ථ නිරූපන බලන්න. උදා: සීටී ස්කෑන් / එම්ආර්අයි/ ඊසීජී වාර්තා / පිළිකා සඳහා ව්‍යාධිවේද වාර්තා, CABG සඳහා කිරීටක ඇන්ජියෝග්‍රෑම් වාර්තාව ආදිය)

සැලකිය යුතුයි: ළඟම පිහිටි සෙලින්කෝ ලයිෆ් ශාඛා කාර්යාලය වෙතින් හිමිකම් පෑමේ පෝරම ලබා ගැනීමේ හැකියාව ජීවිත රක්ෂිතයා / හිමිකම් පාන්නා හට පවතියි. https://www.ceylincolife.com/easy-life/ වෙතින් හිමිකම් පෑමේ පෝරම බාගත හැකිය.

රක්ෂණ ඔප්පුවේ නීතිරීති සහ කොන්දේසි අනුව හිමිකම් පෑම ගෙවිය යුතුව පවතියි නම්, එවැනි හිමිකම් පෑමක් පිළිගැනීමේ දින සිට දින දාහතර (14)ක් ඇතුළත සමාගම විසින් හිමිකම් පෑමේ මුදල ගෙවනු ඇත.

පැමිණිලි සහ දුක්ගැනවිලි හැසිරවීමේ ක්‍රියාපටිපාටිය (Complaint and Grievance Handling Procedure)

සේවාව සම්බන්ධයෙන් ඔබ සෑහීමට පත් නොවේ නම්, පහත දැක්වෙන ඕනෑම මාර්ගයක් හරහා ඔබට පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.

- දුරකථන හරහා: 0112 461 461
- විද්‍යුත් තැපැල් හරහා: care@ceylife.lk, service@ceylife.lk
- වට්ස්ඇප් / වයිබර් හරහා: 0775 776 556
- තැපැල් මගින්: පාරිභෝගික සේවා, අංක 106, හැව්ලොක් පාර, කොළඹ 05
- සමාගමේ වෙබ්අඩවිය හරහා: ඔන්ලයින් පාරිභෝගික විමසීම්, www.ceylincolife.com
- ළඟම ශාඛාව / ප්‍රධාන කාර්යාලය වෙත යාම මගින්

පැමිණිලි, සෙලින්කෝ ලයිෆ් හි ප්‍රධාන මෙහෙයුම් නිලධාරි වෙත යොමු කළ හැකිය. අභියාචනා, සෙලින්කෝ ලයිෆ් හි කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී වෙත යැවිය හැකිය. රක්ෂණ

ඔම්බුඩ්ස්මාන්වරයා හෝ රක්ෂණ නියාමන කොමිෂන් සභාව හරහා වැඩිදුර සමාලෝචන ලබාගත හැකිය. වැඩි විස්තර සඳහා, රක්ෂණ ඔප්පු අත්පිංච හි **8 වන වගන්තිය** බලන්න, හෝ https://www.ceylincolife.com/wp-content/uploads/2025/02/Complaints-handling-procedure-1-1.pdf වෙත පිවිසෙන්න.